# කම්කරු සාන්ත ජුසේ මුනි
## අනුස්මරණය

## පළමුවන දේව ප්‍රකාශනය කොලොස්සි 3:14–15, 17, 23–24

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් කොලොස්සිවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"ඔබ සේවය කරන්නේ ස්වාමින් වහන්සේටය."

මේ සියල්ලට ඉහළින් සියල්ල සම්පූර්ණ ලෙස ඒකාබද්ධ කරන ප්‍රේමයෙන් සැරසෙන්න. ක්‍රිස්තුන් වහන්සේගේ සාමය ඔබේ සිත් තුළ රජකම් කෙරේ වා! එක ම ශරීරයේ කොටස් වශයෙන් ඔබ කැඳවන ලද්දේ මේ සඳහා ය. කෘතඥතාව ද දක්වන්න.

තවද, ඔබ වචනයෙන් හෝ ක්‍රියාවෙන් හෝ කුමක් කරතත්, ඒ සියල්ල ජේසුස් ස්වාමින් වහන්සේගේ නාමයෙන් කරමින් උන් වහන්සේ තුළින් දෙවි පියාණන් වහන්සේට ස්තුති කරන්න. ඔබ කරන කොයි දෙයක් වුවත්, මනුෂ්‍යයන් උදෙසා නොව, සමිඳාණන් වහන්සේ උදෙසා කරන දෙයක් මෙන් මුළු සිතින් කරන්න. සමිඳාණන් වහන්සේ පොරොන්දු වූ විපාකය ඔබට දෙන බව සිහි කරන්න. මන්ද, ඔබ සේවය කරන්නේ ඔබේ ස්වාමින් වන ක්‍රිස්තුන් වහන්සේට ය.

*දේව වචනය මෙසේ ය.*

*හෝ*

## පළමුවන දේව ප්‍රකාශනය උත්පත්ති 1:26 – 2:3

*උත්පත්ති පොතෙන් උපුටා ගත් කොටසකි.*

"වර්ධනය වෙමින් පොළොව පුරවා එය යටත් කර ගන්න."

ඉන්පසු දෙවියන් වහන්සේ: "අපගේ ස්වරූපය අනුව, අපගේ සමානත්වය ලෙස මනුෂ්‍යයා මවමු, ඔහු මුහුදේ මසුන් ද අහසේ පක්ෂීන් ද ගවමහීෂයන් ද මුළු පොළෝ තලයෙහි සියලු වන මෘගයන් ද උරගයන් ද පාලනය කෙරේවා!"යි අණ කළ සේක.

දෙවියන් වහන්සේ තම ස්වරූපය අනුව මිනිසා මැවූ සේක: දෙවියන් වහන්සේගේ ම ස්වරූපය අනුව ඔවුන් මවා වදාළ සේක: පුරුෂයා ද ස්ත්‍රිය ද වශයෙන් ඔවුන් මැවූ සේක. දෙවියන් වහන්සේ ඔවුන්ට ආසිරි පතමින්, "නුඹලා දරුසම්පත් ලබා, වැඩි වර්ධනය වී, පොළොව පුරා පැතිර එය යටත් කරගන්න. මුහුදේ මසුන් කෙරෙහි ද, අහසේ පක්ෂීන් කෙරෙහි ද, පොළොවේ සැරි සරන සියලු සතුන් කෙරෙහි ද බලය පවත්වන්නැ"යි ඔවුන්ට වදාළ සේක. තවද, ඔවුන් වහන්සේ, "මුළු පොළෝ තලයෙහි ධාන්‍ය දරන සියලු පැළෑටි ද බීජ සහිත පල දරන සියලු ගස් ද නුඹලාගේ ආහාරය පිණිස වේ වා! එහෙත්, පොළොවේ සියලු වන සතුන්ට ද අහසේ පක්ෂීන්ට ද උරගයන්ට ද සියලු ජීවමාන සතුන්ට ද ආහාර පිණිස තිල් පලා දෙමි"යි වදාළ සේක. එසේ ම විය. දෙවියන් වහන්සේ තමන් මවා වදාළ සියලු දේ නරඹා, එය ඉතා මනහර බව දුටු සේක. සවස ගත විය, උදය උදාවිය, ඒ සය වන දවස ය.

මෙසේ අහසත්, පොළොවත් එහි ඇති සියලු දේත් මවා නිමකරන ලද්දේය. දෙවියන් වහන්සේ තමන් කළ කාර්යය සත් වන දවසෙහි නිමවා, එදින සියලු වැඩ නතර කළ සේක. මෙසේ උන් වහන්සේ සත් වන දවසට ආසිරි පතා එය ශුද්ධ දවසක් ලෙස වෙන් කර වදාළ සේක. එසේ කළේ ඒ දවසේ උන් වහන්සේ සිය මැවීමේ කාර්යය නිමවා, වැඩ නතර කළ හෙයිනි.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 90:2-4, 12-14, 16

පිළිතුර: දෙවිඳුනි, අපේ කාර්යයන් ජයෙන් ජයටම පැමිණේවා!

ගීය : කඳු හෙල් ඇති වන්නට පෙර සිට
ඔබ පොළොව ද සක්වළ ද මවන්නට පෙර සිට
සදාකාලයෙන් සදාකාලයට ම
ඔබ දෙවියන් වහන්සේ වන සේක.
ඔබ මිනිසා යළි දූවිල්ලට හරවන සේක,
“මිනිසුනි, දූවිල්ලට හැරේවා” කියා ඔබ වදාරන සේක.

ඔබ ඇස් ඉදිරියෙහි වසර දහසක්.
ගෙවී ගිය ඊයේ දවස වැනි ය,
රෑයේ එක යාමයක් වැනි ය.
දිවි පෙවෙත කොතරම් ලුහුඬු ද කියා වටහා දුන මැනව.
මෙය මෙනෙහි කරන පිණිස නැණවත් සිතක් අපට දුන මැනව.

සමිඳුනි, මෙපමණ දිගු කලක් ඈත් වී නොසිට
ඔබ අප වෙත පෙරළා පැමිණිය මැනව.
ඔබේ දාසයන්ට අනුකම්පා කළ මැනව.
උදයෙන් උදය ඔබේ ප්‍රේමයෙන් පිරී අපි අවදි වමු.
දිවිය පුරා තුටු පහටු සිතින් අපි ගී ගයමු.

ඔබේ ප්‍රබල ක්‍රියා ඔබේ මෙහෙකරු අපට ද
ඔබේ තේජස අප පරපුරට ද දක්නට වරම් දුන මැනව.

## සුපුවත් ජය නද ගීතාවලිය 68:19

ආලේලූයා! ආලේලූයා!
දවසින් දවස අපේ බර උසුලන
සමිඳුන් හට පැසසුම් වේ වා!
එතුමාණෝ අප ගලවන දෙවිඳාණෝ වන සේක.
ආලේලූයා!

## සුවිශේෂය මතෙව් 13:54–58

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### "මොහු වඩුවාගේ පුතා නොවේද?"

ජේසුස් වහන්සේ සිය රටට පැමිණ, ධර්මශාලාවේදී ඔවුන්ට ඉගැන් වූ සේක. ඔව්හු විස්මයට පත් ව, "මොහුට මේ ප්‍රඥාව හා හාස්කම් කිරීමේ බලය කොහෙන් ලැබුණේ ද? මොහු වඩුවාගේ පුතා නොවේ ද? මොහුගේ මවගේ නම මරියා නොවේ ද? මොහුගේ සහෝදරයෝ ජාකොබ්, ජෝසෙප්, සීමොන් සහ ජුදස් නොවෙත් ද? මොහුගේ සියලු සහෝදරියෝත් අප අතරෙහි නොවෙත් ද? එසේ නම්, මේ සියල්ල මොහුට කොහෙන් පහළ වී ද?" කියා උන් වහන්සේ ප්‍රතික්ෂේප කළහ. එහෙත් ජේසුස් වහන්සේ කතා කොට, "දිවැසිවරයෙකුට ගරුබුහුමන් නොලැබෙන්නේ සිය රටේ දීත්, සිය ගෙදර දීත් පමණකැ"යි වදාළ සේක. ඔවුන්ගේ අවිශ්වාසය නිසා උන් වහන්සේ එහි දී බොහෝ හාස්කම් නොකළ සේක.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*